# [04]
# ළමා ශ්‍රම උපයෝජනය පිළිබඳ ශ්‍රී ලංකාවේ නීතිය

එම්. එස්. වීරවන්නි, කේ. කේ. එන්. ප්‍රියංජලී, බී. එම්. එන්. වාසනා ගමගේ, එන්. ගුණවර්ධන, බී. එන්. ආර්. ඩී. කුරේ

**හැඳින්වීම**
ශ්‍රම උපයෝජනය සඳහා විවිධ නීති රීති ශ්‍රී ලංකාව තුළ පවතී. මෙම නීති රීති අතර ළමා ශ්‍රම උපයෝජනය සඳහා විවිධ අණපනත් සහ සම්මුතීන් පවතී. මෙම අණ පනත් සහ සම්මුතීන් පිළිබඳ දැනුවත් ව හෝ නොදැනුවත් ව සංවිධාන කළමනාකරුවන් ක්‍රියා කරනු ලබන බව පෙනේ. සංවිධාන මානව සම්පත් කළමනාකරුවන් ලෙසට මෙකී නීති රීති පිළිබඳ අවබෝධයක් ලබා සිටීම වැදගත් වේ. මෙම ලිපියෙන් අපේක්ෂා කරනුයේ ළමා ශ්‍රම උපයෝජනය පිළිබඳ විමර්ශනයක යෙදීමයි.

**ළමයා හා ළමා ශ්‍රම උපයෝජනය**
වයස අවුරුදු 14ට අඩු අයෙක් ළමයෙකු ලෙස හඳුන්වන අතර වයස අවුරුදු 14ට අඩු කිසිම අයෙක් කිසිදු සේවයක යෙදවිය නොහැකිය (1956 අංක 17 දරණ ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ පනත). ළමයාගේ සෞඛ්‍යයට, වර්ධනයට මෙන්ම එහි පැවැත්මට හානිකර වන සියලු වැඩ ළමා මෙහෙකාර සේවයට අයත්වන අතර, ශාරීරිකව, මානසිකව හා සමාජීය වශයෙන් දරුවන් එවැනි අනතුරුදායක, පීඩාකාරී වැඩ හා ක්‍රියාකාරකම් වල නිරත කරවීම ළමා අයිතිවාසිකම් උල්ලංඝණය කිරීමක් ලෙස සලකනු ලැබේ (ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය).

ළමුන් ශ්‍රමිකයන් ලෙස යොදා ගැනීම අද වන විට ලෝකය පුරා ව්‍යාප්ත වී පවතින බරපතල ගැටලුවකි. සංඛ්‍යාත්මක වශයෙන් ලෝකය පුරා ළමා මෙහෙකරුවන් මිලියන 240ක් පමණ සිටින අතර ඉන් මිලියන 180ක් ඉතා අන්තරායකාරී වෘත්තීන්හි නිරත වී සිටිති (ළමා මෙහෙකාර සේවාවෙන් තොර අනාගතයක්, 2002). ළමා ශ්‍රම භාවිතය වඩාත් තදබල ලෙස ව්‍යාප්ත වී ඇත්තේ ලෝකයේ සංවර්ධනය වෙමින් පවතින හා ඌණ සංවර්ධිත රටවල් ලෙස සැලකෙන දුප්පත් රටවලයි.

**ළමා ශ්‍රම භාවිතයට හේතු හා ඒ පිළිබඳ ලෝක ප්‍රජාවගේ අවධානය**
ළමුන් ශ්‍රමිකයන් ලෙස යොදා ගැනීම සඳහා පාදක වන හේතු ගණනාවක් දක්නට ලැබේ. ඒවා නම් (ළමා ලංකා, 2000).

***දිළිඳුකම***
ඉතා බාල වයසේ සිට ළමුන් සේවයේ යෙදීම හා සූරා කෑමේ තත්වයට පත්වීමට ප්‍රධාන සාධකය වන්නේ දිළිඳුකමයි.

*අධ්‍යාපන අවස්ථා මඳවීම*
අඩු අධ්‍යාපන පහසුකම්, ඍජු හා නොපෙනෙන අධ්‍යාපන වියදම් හා ලබාදෙන අධ්‍යාපනයේ පහත් මට්ටම් යන සියලු කරුණු ඒකාබද්ධ ව මේ ගැටලුවට හේතු සාධක වේ.

*පවත්නා සමාජ සංස්කෘතික සාරධර්ම*
බොහෝ විට පිළිගනු ලබන, දිගු කාලීනව පවත්නා හා වෙනස් කිරීමට නොකැමති ගති, සිරිත් හා පුරුදු වැදගත් ලෙස බලපාන හේතු සාධක වේ.

*ආර්ථික සංවර්ධනය හා ව්‍යුහාත්මක වෙනස්කම්*
ආර්ථික සංවර්ධනය බොහෝ ආසියානු ජනතාවගේ ජීවන තත්වයන්හි දියුණුවක් ඇති කිරීමට හේතු වුවත් වැඩ කරන ළමයින්ගේ තත්වය තවත් නරක අතට පත් කිරීමට හේතු වේ.

***ආදේශ කල නොහැකි පුහුණු තර්කය***

ළමයින් උපදව සහිත කර්මාන්ත වල යෙදවීම සම්බන්ධව සේවා යෝජකයන් අතර ඇති පොදු සාධාරණීකරණය වන්නේ වැඩිහිටි සේවකයන් සොයා ගැනීමට ඇති අපහසුතාවයයි.

***ළමා ශ්‍රමය තාර්කාන්විතය***

"ළමා ශ්‍රමය ලාභදයකය" යන තර්කය හැම විටම නොගැලපේ. ළමයින් වැඩිහිටියන් සමග සම සමව වැඩ කරන අතර ඔවුන්ට ගෙවනු ලබන දීමනාව අඩු වුවත් වෙනස එතරම් නොසැලකිය යුතු තරමය.

ළමා ශ්‍රම භාවිතය සම්බන්ධයෙන් පුළුල් ලෙස ලෝක ප්‍රජාවගේ අවධානය යොමුව ඇති අතර එයට අදාළ ප්‍රකාශ පහත දක්වේ.


> *ළමයින්ගේ සිහින් දුර්වල අත් වලින් ගොඩනගනු ලබන ආර්ථික ප්‍රගතිය කිසිසේත් ආසියාවේ නොවිය යුත්තකි. ළමයින් ඔවුන්ගේ අධ්‍යාපනයෙන් ඉවත් කොට ඔවුන් ශ්‍රම වෙළෙඳපොල කෙරෙහි යොමු කිරීම ඔවුන්ගේ අනාගතය ඇත්ත වශයෙන්ම ඔවුනගෙන් සොරා ගැනීමකි (දකුණු කොරියානු අගමැති කිම් ඩේ ජුං, 1998).*


> *මොලොව පවතින සියළුම කටයුතු වලින් වඩාත් හානිකර පුරුද්ද වන්නේ ළමා අපයෝජනයයි (ඇමෙරිකානු එක්සත් ජනපද ජනාධිපති බිල් ක්ලින්ටන්, 1998).*

**ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රම බලකාය**

ශ්‍රී ලංකාවේ ජනගහනය මිලියන 20.6ක් පමණ වන අතර ම ජනගහනයෙන් 24.5%ක් පමණ අවුරුදු 14ට අඩු ජනගහනය වේ. (Data from UNDP Human Development Report, 2004) ශ්‍රී ලංකාවේ මිලියන 1කට ආසන්න ළමා පිරිසක් ශ්‍රමිකයන් ලෙස යොදවා ඇති අතර ඔවුන්ගෙන් 926, 038 ක් වන ප්‍රමාණයක් අවුරුදු 5 - 17ක් අතර පසුවන්නන් වෙයි. එම ප්‍රමාණය එම වයස් බාණ්ඩයේ දරුවන්ගෙන් 21%ක් පමණ වේ. ආර්ථික ක්‍රියාකාරකම් වල නිරත වන පිරිමි ළමයි ප්‍රමාණය 26%ක් වන අතර ගැහැණු ළමයි ප්‍රමාණය 17%කි (The child Activity Survey, 1999). ළමුන්ගෙන් 19. 000 ක් පමණ ගෘහස්ථ මෙහෙකාර සේවයේ යොදවා ඇත. ගෘහස්ථ මෙහෙකාර සේවයේ යෙදවීම ඔවුන්ගේ මානසික වර්ධනය සඳහා තර්ජනයක් වන අතර අවසානයේ දී එය ජාතියක් වශයෙන් නැගී සිටීමේ දී මුළු ජාතියටම බලපායි. මොවුන්ගෙන් සමහරෙකුගෙන් මුදල් ගෙවීම මත ශ්‍රමය ලබාගන්නා අතර ඇතමුන්ට කිසිදු ගෙවීමක් සිදු නොකරන අවස්ථා ද දැකගන්නට ලැබේ. කුඩා ළමයින් ව යොදවා නීති විරෝධී මත් ද්‍රව්‍ය ජාවාරම්, ගණිකා වෘත්තියේ යෙදවීම වැනි දෑ ලංකාව තුළ ද ලෝකය තුළ ද ඉතා සීඝ්‍රයෙන් පැතිරී යන දෑ වෙයි (Lanka Newspapers.com).

ශ්‍රී ලංකාව තුළ වයස අවුරුදු 5 - 14 අතර සේවයේ යොදවා ඇති ළමුන් ගණන 475531 වන අතර මොවුන්ගෙන් 91615ක්ම වයස අවුරුදු 9ට වඩා අඩු අය වේ. (ILO සමීක්ෂණය, 1999) ළමා ගණිකාවන් ප්‍රමාණය ආසන්න වශයෙන් 40000ක් පමණ වේ (Complaints of violent crimes against children). ළමයින් කෘෂි කාර්මික, කාර්මික හා සේවා අංශ වල සේවයේ යොදවා ඇති ප්‍රමාණයන් පහත ප්‍රස්තාර දෙක මඟින් දක්වා ඇත.



**ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රම උපයෝජනය පිළිබඳ නීතිය**
ශ්‍රී ලංකාවේ ළමා ශ්‍රම උපයෝජනය විධිමත් කිරීම සඳහා විවිධ අණ පනත් පිහිටුවා ඇත. එම අණපනත් මෙසේ සාරාංශ කර පෙන්විය හැකිය.

**ජාතික ප්‍රතිපත්ති හා නීති**

- ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව (රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධ මූලධර්ම - iv පරිච්ඡේදය)
- ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය
- ජාතික නීති
- අනිවාර්ය අධ්‍යාපන රෙගුලාසි

**ජාතික නීති**

- 1956 අංක 45 දරණ ස්ත්‍රීන්, තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ පනත
- 1957 ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ රෙගුලාසි
- 1957 තරුණ අය මුහුදු කටයුතු සේවයේ යෙදවීම පිළිබඳ රෙගුලාසි
- 1957 කාර්මික ආයතනවල තරුණ අය රාත්‍රි කාලයේ සේවයේ යෙදවීම පිළිබඳ රෙගුලාසි
- 1942 අංක 45 දරණ කර්මාන්ත ශාලා ආඥා පනත
- 1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල සේවක පනත (සේවයේ යෙදවීම හා ශ්‍රමිකයින් විධිමත් කිරීම)
- 1927 අංක 27 දරණ අවම වැටුප් (ඉන්දියානු) ආඥා පනත
- පතල් (ස්ත්‍රී සේවිකාවන් පතල් වල සේවයේ යෙදවීම තහනම් කිරීම) ආඥා පනත

**ජාත්‍යන්තර බැඳීම් (ශ්‍රී ලංකාව විසින් අනුමත කොට ඇති ජාත්‍යන්තර සම්මුතීන්)**

- ළමයින්ගේ අයිතිවාසිකම් පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මුතිය
- ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ සම්මුතීන්
  - අංක 05 දරණ අවම වයස් (කර්මාන්ත) සම්මුතිය - 1919
  - අංක 07 අවම වයස් (මුහුදු සම්මුතිය) - 1920
  - අංක 10 අවම වයස් (කෘෂි කාර්මික) සම්මුතිය - 1921
  - අංක 58 අවම වයස් (මුහුදු) සම්මුතිය - සංශෝධිත, 1936
  - අංක 138 රැකියාවට ඇතුල්වීම සඳහා අවම වයස් සම්මුතිය

**1956 අංක 47 දරණ ස්ත්‍රීන් තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ පනත**
1956 අංක 47 දරණ ස්ත්‍රීන් තරුණ අය හා ළමයින් සේවයේ යෙදවීමේ පනතේ විධි විධාන අනුව වයස අවුරුදු 14ට අඩු අයෙක් කිසිම සේවයක යෙදවීම සම්පූර්ණයෙන්ම තහනම් වේ. එම නීති ක්‍රියාවට නැංවීමේදී විමර්ශනය කිරීම මූලික වන අතර විමර්ශනය තුළින් රැස් කරන සාක්ෂි අනුසාරයෙන් පැමිණිලි චෝදනා පත්‍ර සකස් කර කම්කරු කොමසාරිස්වරයාගේ අනුමැතිය ඇතිව නඩු පැවරීම සිදු කරනු ලැබේ.

2003 අංක 08 දරණ සංශෝධනය අනුව වයස අවුරුදු 14ට අඩු ළමයින් සේවයේ යෙදවුවහොත් මහේස්ත්‍රාත් උසාවියක නඩු පැවරීමත් එයින් වරදකරු වුවහොත් රු.10, 000ක දඩයක් හෝ මාස 12ක සිර දඬුවමක් නියම කල හැකි අතර අගතියට පත් ළමයා වෙනුවෙන් වන්දියක් නියම කිරීමට මහේස්ත්‍රාත්වරයාට බලතල පවරා ඇත. 2006 අංක 24 දරණ අවුරුදු 18ට අඩු කිසිම තැනැත්තෙකු උපද්‍රවකාරී රැකියාවල නිරත කිරීම තහනම් කරන ලද අතර ඉහත පනතේ විධිවිධාන ඉහත සඳහන් අයුරින්ම ක්‍රියාත්මක කරන ලද අතර වයස් සීමාව අවුරුදු 18 දක්වා වැඩි කරන ලදී. මෙම පනතට අනුව වයස අවුරුදු 16ට ළඟා නොවූ

ළමයින්ව දිනකට පැය 12 කට වඩා සේවයේ යෙදවීම තහනම් වන අතර ඔවුන්ගේ සේවය ලබා ගැනීම පෙ.ව 6.00 ට පෙර ආරම්භ කළ නොහැකි වන අතර ප.ව. 6.00න් පසු ඔවුන්ව සේවයේ යෙදවිය නොහැක (ළමා සවිය සඟරාව, 2008).

**1954 අංක 19 දරණ සාප්පු හා කාර්යාල සේවක පනතේ විධි විධාන**

වයස අවුරුදු 14ට අඩු පිරිමි දරුවන් ද වයස අවුරුදු 18ට අඩු ගැහැණු දරුවන් ද සේවයේ යෙදවීම මෙම පනත යටතේ සිදු කළ නොහැකි අතර කාන්තාවන් පෙ.ව. 6.00ට පෙර හා ප.ව. 6.00ට පසු සේවයේ යෙදවීම මේ පනත යටතේ සිදු කළ නොහැක.

**1997 අනිවාර්යය අධ්‍යාපන ක්‍රියාත්මක කිරීමේ පනත**

මෙම පනත අනුව වයස අවුරුදු 5 - 14 අතර පසුවන ළමුන් අනිවාර්යෙන්ම අධ්‍යාපනයට යොමු කළ යුතුය. මෙම පනත ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමින් පරිවාස හා ළමා ආරක්ෂණ දෙපාර්තමේන්තුවේ "ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරී" නමින් පිරිසක් බඳවා ගෙන ඇත. එමගින් ළමා අයිතිවාසිකම් ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම හා එම ප්‍රඥප්තියේ ළමුන් සැමට අධ්‍යාපනය ලබාදීමේ අයිතිය තහවුරු කර ඇත.

මීට අමතරව 2005 අංක 30 දරණ වෛශ්‍යා වෘත්තිය සඳහා කාන්තාවන් සහ ළමයින් ජාවාරම් කිරීම වැළැක්වීම පනත යටතේද ළමා ශ්‍රම උපයෝජනයට අදාල විධි විධානයන් දක්වා ඇත. ළමා ශ්‍රම උපයෝජනය පිළිබඳ කෙතරම් නීති රීති පැවතිය ද ඒවා නිසි ආකාරයෙන් ක්‍රියාත්මක නොවේ නම් එම නීති ඵල රහිත වේ. එබැවින් එම නීතීන් සාර්ථකව ක්‍රියාත්මක කිරීම වඩාත් ශක්තිමත් කිරීම සඳහා පහත සඳහන් ප්‍රධාන අංශයන් යටතේ වඩා විධිමත් හා පුළුල් ලෙස අවධානය යොමු කළ යුතුය (BMICH හිදී පවත්වන ලද විනිසුරුවන් 75 දෙනෙකුගෙන් යුත් සම්මන්ත්‍රණය 1999, ජූනි).

- අදල නිතී ගැන යළි සලකා බැලීම.
- දඬුවම් වැඩි කිරීම.
- ළමා අධිකරණයේ කාර්යයභාරය හා නීති තත්වය සම්බන්ධ නිසි අවබෝධය
- කම්කරු දෙපාර්තමේන්තුව, පරිවාස හා ළමා රක්ෂණ දෙපාර්තමේන්තුවල නිලධාරීන් අතර විධිමත් සම්බන්ධතාවයක් ගොඩ නැගීම.
- නීති ක්‍රියාත්මක කිරීමේ නිලධාරීන් සඳහා උසස් මට්ටමේ තාක්ෂණික පුහුණු වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම.

ළමයින් සේවයේ යෙදවීම පිළිබඳ නීතිය ක්‍රියාත්මක කරනු ලබන මූලික ම ආයතනය කම්කරු දෙපාර්තමේන්තුව වන අතර මීට අමතර ව පොලිස් දෙපාර්තමේන්තුව, පරිවාස හා ළමා රක්ෂණ සේවා දෙපාර්තමේන්තුව වැදගත් වේ. හෙට දිනයේ පුරවැසියා වනුයේ අද දිනයේ දරුවාය. එම නිසා ළමා ශ්‍රමික ගැටලුව විසඳීම හා ළමා පරපුර සුරැකීම අපගේ යුතුකමත්, වගකීමක් හා සමාජ මෙහෙවරක් වේ. එබැවින් වයස අවුරුදු 14ට අඩු ළමයකු සේවයේ යොදවන්නේ නම් අදල පාර්ශවයන් වෙත ඒ පිළිබඳව දැනුම් දීම අප සතු වගකීමකි.

**මානව සම්පත් කළමනාකරණය සහ ළමා ශ්‍රම උපයෝජනය**

මානව සම්පත් කළමනාකරණයට අනුව සංවිධානයක පරමාර්ථ ඉටු කිරීමට ප්‍රශස්ත දයකත්වයක් ලැබෙන අයුරින් ශ්‍රම සම්පත් උපයෝජනය කළ යුතු වේ. මෙහිදී ශ්‍රම සම්පත ලෙසට සලකනුයේ විධිමත් ශ්‍රම හමුදවයි. ළමා ශ්‍රමිකයන්, ආබාධිතයන්, රෝගීන් සහ ඉතා මහලු අය මේ ගණයට අයත් නොවිය යුතුය. මානව සම්පත් කළමණාකරුවකු ලෙසට ළමා ශ්‍රම උපයෝජනය පිටු දැකීමට ක්‍රියා කරනු ලබන්නේ නම්, එවිට ඉහත නීති රීති හෝ ප්‍රඥප්ති ආදියේ ක්‍රියාකාරීත්වය අඩපණ කළ හැකිවේ.

**නිගමනය**

මානව සම්පත් උපයෝජනය සංවිධාන කළමනාකරණයේත් සමාජ කළමනාකරණයේත් ඉතා වැදගත් වනුයේ ලොව සියල්ල පදනම් වනුයේ මානවයා නිසාම වන බැවිනි. නමුත් මානව

බලය උපයෝජනය කිරීමේ දී පවතින නීති රීති අනුගමනය කිරීම වැදගත් වනවා මෙන්ම ඒවා අනුගමනය කිරීම සමාජීය වගකීමක් ද වේ.

ශ්‍රී ලංකාව තුළ ළමා ශ්‍රම උපයෝජනය පවතිනවා යනු අප මානව සම්පත් කළමනාකරණ පරිචයේ විවිධ අඩුපාඩුකම් පවතිනවා යන්නය. එනම්, සුබවාදී මානව සම්පත් කළමණාකරණයක් නොමැති බවය. මෙහි වගකීම විවිධ පාර්ශවයන්ට අයිති වෙනවා මෙන්ම මානව සම්පත් කළමණාකරුට හෝ ඒ සඳහා වගකියනු ලබන්නා ද යම්කිසි ප්‍රමාණයක් අදල වේ. මානව සම්පත් කළමනාකරණයේදී මේ පිළිබඳ ව අප මීට වඩා අවධානය යොමු කළ යුතු බව නිගමනයක් ලෙසට පෙනී යයි.

**ආශ්‍රිත ග්‍රන්ථ**

1. ළමා සවිය. (2008). පළමු කලාපය, 3 වෙළුම. ළමා සංවර්ධන හා කාන්තා අභිවෘද්ධි අමාත්‍යාංශයඃ කොළඹ.
2. ළමා ලංකා. (2000). ත්‍රෛමාසික ළමා පුවත් විවරණය. පළමු වෙළුම, අංක 2. අයිපෙක් ශ්‍රී ලංකා.
3. ළමා රක්‍ෂණ අධිකාරිය http://www.child protection.gov.lk.
4. ළමා මෙහෙකාර සේවාවෙන් තොර අනාගතයක්. (2002). ජාත්‍යන්තර කම්කරු සංවිධානය.
5. Data from UNDP Human Development report. 2004.
6. The child Activity Survey. 1999. www.lankanewspapers.com